# හින්දි අධ්‍යයන අංශය

මහාචාර්ය ඉන්ද්‍රා දසනායක මිය

කැලණිය විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර පීඨය යටතේ ස්ථාපිත හින්දි අධ්‍යයන අංශය විශ්වවිද්‍යාලයේ ආරම්භයේ සිට ම පවත්වාගෙන එනු ලබන පැරණිම අධ්‍යයන අංශයකි.

1956 වර්ෂයේ සිදු වූ දේශපාලන පෙරළියත් සමග ම එවක අග්‍රාමාත්‍ය වූ එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මැතිතුමා සිංහල භාෂාව, බෞද්ධාගම හා පෙරදිග සංස්කෘතිය පුනර්ජීවනය කිරීමේ අදිටනින්, පෙරදිග සංස්කෘතියේ කේන්ද්‍රස්ථාන ලෙස පුදනු ලබමින් තිබූ පිරිවෙන්වල උන්නතිය හා සංවර්ධනය උදෙසා වැඩි-වැඩියෙන් රාජ්‍ය අනුග්‍රහය ලබා දෙන ලදි. එවැනි පිරිවෙන් අතරින් කැලණියේ විද්‍යාලංකාර පිරිවෙන හා කොළඹ විද්‍යෝදය පිරිවෙන විසින් ද රට-ජාතිය වෙනුවෙන් මහගු සේවයක් ඉටු කරමින් තිබිණ. එබැවින්, 1959 දී අග්‍රාමාත්‍ය බණ්ඩාරනායක මැතිතුමන් විසින් විද්‍යාලංකාර හා විද්‍යෝදය පිරිවෙන් දෙක විශ්වවිද්‍යාල තත්ත්වයට උසස් කරන ලදි. ආරම්භක අවස්ථාවේ දී භාෂා පීඨය, එසේ ම කලා පීඨය, බෞද්ධ පීඨය හා විද්‍යා පීඨය වශයෙන් පීඨ හතරකට විෂය ධාරාවන් ගොනු කරන ලදි.

පෙරදිග භාෂා ලෙස සිංහල, සංස්කෘත, පාලි හා හින්දි භාෂාවන් සඳහා මෙම විශ්වවිද්‍යාලයේ උසස් ස්ථානයක් හිමි විය. එසේ ම මෙම විෂයයන් භාෂා පීඨයට ඇතුළත් කෙරිණි.

## කැලණිය විශ්වවිද්‍යාලයේ හින්දි අධ්‍යාපනයේ ආරම්භය

1959 දී, විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයේ පෙරදිග භාෂා විෂයයන් සිංහල, සංස්කෘත, පාලි, හින්දි විෂයන් සඳහා වෙන්-වෙන් වූ ස්වාධීන අධ්‍යයන අංශ විවෘත කොට පුහුණුකම් ලත් ආචාර්යවරු පත් කෙරුණි. ඒ අනුව, භාරතයේ නාග්පූර්හි පූජ්‍ය මහාචාර්ය ආනන්ද කෞසල්‍යායන හිමියන්ගේ මූලිකත්වයෙන් හින්දි අධ්‍යාපන කටයුතු ආරම්භ කෙරිණි. හින්දි අංශයේ අංශ ප්‍රධාන තනතුර හොබවමින් උන්වහන්සේ 1968 වර්ෂයේ මුල් භාගය දක්වා ශ්‍රී ලංකාවේ හින්දි